රුහුණ විශ්වවිද්‍යාලය

2017/2018 අධ්‍යයන වර්ෂය

සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2018 අගෝස්තු

SOC 6142 - උසස් සමාජවිද්‍යාත්මක න්‍යාය

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ඔබ තෝරාගනු ලබන ප්‍රශ්නයක සෑම කොටසකට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

එක් පිළිතුරකට ලකුණු 15 කි.

කාලය: පැය 03 යි.

---

01. (අ) සමාජ විද්‍යාත්මකව සමාජයක් අවබෝධ කරගැනීමේ දී වැදගත්වන ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ආ) ඔගස්ටේ කොම්ටේ සම්භාව්‍ය පරිණාමවාදී න්‍යාය පිළිබඳ ඉදිරිපත් කළ අදහස් විවේචනාත්මක ව සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ඇ) සරල සමාජයක් සංකීර්ණ වීම පිළිබඳ හර්බට් ස්පෙන්සර්ගේ විග්‍රහය විවේචනාත්මක ව විභාග කරන්න.

(ලකුණු 05)

02. (අ) නූතනත්ව ව්‍යාපෘතියෙහි මූලික ලක්ෂණ කවරේ ද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) එම ව්‍යාපෘතියට එරෙහිව ඉදිරිපත් වී ඇති විවේචන සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ඇ) පශ්චාත් නූතනවාදී සමාජ න්‍යායයේ මූලික ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 05)

03. (අ) කෘත්‍යවාදය යනු කුමක්දැයි එහි දැක්වෙන මූලික ගති ලක්ෂණවලට අනුව කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

(ආ) පවුල නම් කුඩා සමූහය හෙවත් ආයතනය මගින් කිසියම් සමාජයක සමබර පැවැත්ම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව කෘත්‍යවාදී විශ්ලේෂණයට අනුව තහවුරු කර දක්වන්න.

(ලකුණු 05)

(ඇ) සමාජ ස්තරායනය යනු කෘත්‍යමය අවශ්‍යතාවයක් බව කිංස්ලි ඩේවිස් හා විල්බට් මුවර් යන අයගේ පිළිගැනීමයි. මේ පිළිබඳව ඔබේ ස්ථාවරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

04. (අ) කාල්මාක්ස්ගේ සංඝටනවාදී අදහස් 20 වැනි සියවසට සාපේක්ෂව සලකා බලන කළ යල් පැන ගොස් ඇති බවට රැල්ෆ් ඩැරන්ඩෝෆ් විසින් ඉදිරිපත් කරනු ලබන මතය කෙතරම් දුරට සාධාරණ ද? පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

(ලකුණු 05)

(ආ) ආධිපත්‍යය යනු කුමක්දැයි ඩැරන්ඩෝෆ්ගේ විවරණයට අනුව කෙටියෙන් පැහැදිලි කර නවීන ධනේෂ්වර සමාජ ක්‍රමය තුළ ආධිපත්‍යයෙහි කාර්ය භාරය පහදන්න.

(ලකුණු 05)

(ඇ) පශ්චාත් ධනේෂ්වර සමාජවල ගැටුම් උද්ගත විය හැකි බවට ඩැරන්ඩෝෆ් විසින් ඉදිරිපත් කරනු ලබන මතයට පදනම් වන හේතු සාධක කවරේ ද?

(ලකුණු 05)

05. (අ) පද්ධතියක් (System) යනු කුමක්දැයි නිදසුන් ඇසුරින් කෙටියෙන් පහදන්න.

(ලකුණු 05)

(ආ) නූතන පද්ධති සමාජයේ සන්නිවේදනයට හිමි වන ස්ථානය නික්ලාස් ලූමන්ට අනුව ප්‍රමාණය කර දක්වන්න.

(ලකුණු 05)

(ඇ) නවීන පද්ධති සමාජය තුළ ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස විශ්වාසය වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 05)

06. (අ) ගොවි පංතිය පිළිබ නව මාක්ස්වාදී විග්‍රහය සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ආ) 'සත්‍යය' පිළිබඳ හෙගෙලියානු දර්ශනය විග්‍රහ කරන්න.

(ලකුණු 05)

(ඇ) ද්විසටනාත්මක භෞතිකවාදය පිළිබඳ මාක්ස්වාදී විග්‍රහය පරීක්ෂා කරන්න.

(ලකුණු 05)

07. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

(අ) ඓන්ද්‍රීය සාදෘෂ්‍යය
(ආ) ව්‍යුහකරණය පිළිබඳ න්‍යාය
(ඇ) අධිනිශ්චය කිරීම
(ඇ) සන්ධියකරණය

(එක් සටහනකට උපරිම ලකුණු ප්‍රමාණය 7.5කි.)

@@@@@@@@